# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2307/22 – 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා – 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1991 නොවැම්බර් මස 20 වැනි දින අංක 689/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1991 අංක 166 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

*මගේ අංකය:* 03J/91/LRB/113-II-වෙළුම.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාගේ අංකය:* GCF/ATH/KL/02/LR.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව උප දිසාපති කොට්ඨාසයේ, අධිකාරි පත්තුව අඹතලෙන් පහල අළුත්කුරු කෝරළය සුළු කොට්ඨාසයේ, ගොතටුව නව නගරය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 7415 හා 2004.02.16 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 154 – පිටවගුරෙකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.025**
උතුරට: කැබලි අංක 152, 153 සහ 14; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 14 සහ 147; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 147 සහ ව. අ. 32 සහ නින්දහේන පාර; බටහිරට: ව.අ. 32, නින්දහේන පාර, කැබලි අංක 152 සහ 153.

EOG 11 – 0253